# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 40 දරන
# ණය (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 නොවැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 දෙසැම්බර් මස 03 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 20 යි — තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 40 දරන ණය (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1982 නොවැම්බර් මස 3 වන දින.]

එල්. ඩී.—ඕ. 45/82.

**කිසියම් කාල පරිච්ඡේදයක් තුළ දරනු ලබන වියදම් සඳහා බලය දෙන විසර්ජන පනතක් සම්මත කර නොමැති අවස්ථාවක, ඒ කාල පරිච්ඡේදය තුළ ආණ්ඩුවේ සේවාවන් සඳහා ශ්‍රී ලංකාව තුළින් හෝ ඉන් බාහිරව ණය ලබා ගැනීමට බලය ලබාදීම සඳහා ද ඒ සේවාවන් සඳහා ඒ කාල පරිච්ඡේදය තුළ අවශ්‍ය වන මුදල් ඒ ණය වලින් ගෙවීමට විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1982 අංක 40 දරන ණය (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙන වෙනත් යම් නීතියකට හානියක් නොමැතිව, පාර්ලිමේන්තුව විසින් විසර්ජන පනතක් සම්මත කරනු නොලැබූ ආණ්ඩුවේ යම් මුදල් වර්ෂයක පළමුවන දිනයෙන් ආරම්භව ඒ මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසාන වන (මේ පනතෙහි "අදාළ කාල පරිච්ඡේදය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් කාල පරිච්ඡේදයක් සඳහා යම් නීතියක් මගින් හෝ ඒ යටතේ විධිවිධාන සලස්වනු ලැබ ඇති නැතහොත් අන්‍යාකාරයකින් නීත්‍යානුකූලව බලය දී ඇති ආණ්ඩුවේ යම් වියදමක්, ශ්‍රී ලංකාව තුළ වූව ද ඉන් බාහිරව වුව ද ආණ්ඩුව සඳහා හෝ වෙනුවෙන් ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වලින් දරනු ලැබිය හැකි ය. එසේ වුව ද අදාළ කාල පරිච්ඡේදය තුළ වූ කවර හෝ මාස තුනක කාල පරිච්ඡේදයක් සඳහා ලබා ගන්නා ණය වලින් ලැබෙන මුළු මුදල, ආණ්ඩුවේ ඉගතීත් වූ මුදල් වර්ෂය සඳහා ලබා ගැනීමට ඒ මුදල් වර්ෂය සඳහා වූ විසර්ජන පනතින් බලය දී ඇති මුළු ණය ප්‍රමාණයෙන් හතරෙන් එක් පංගුවක් නොඉක්මවිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් විසර්ජන පනතක් සම්මත කරනු නොලැබූ යම් මුදල් වර්ෂයක පළමුවන දිනයෙන් ආරම්භව විසර්ජන පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල පරිච්ඡේදය තුළ ආණ්ඩුවේ සේවාවන් සඳහා ණය ලබා ගැනීමේ බලය.

ඡ 60168 — 13,100 (82/10)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.